**රජයේ නිවේදන**

**1999 අංක 08 දරන දුම්කොළ බදු පනත**

**1999 අංක 08 දරන දුම්කොළ බදු පනත යටතේ බීඩි සඳහා දුම්කොළ බද්දක් පැනවීම**

2004 අංක 09 දරණ දුම්කොළ බදු (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු වූ එම පනතේ 21 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි පහත දැක්වෙන නියෝග ප්‍රකාශයට පත් කරමි.

රනිල් වික්‍රමසිංහ

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේදිය.

නියෝග

1. මෙම නියෝග බීඩි සඳහා දුම්කොළ බදු අය කිරීමේ නියෝග ලෙස හඳුන්වනු ලබන අතර මෙම නියෝග 2023 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.
2. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම බීඩියක් සඳහාම රුපියල් දෙකක (රු. 2/-ක) අනුප්‍රමාණයට දුම්කොළ බද්ද අය කරනු ලැබිය යුතු වන්නේ ය.
3. බීඩි නිෂ්පාදකයකු වශයෙන් වලංගු ලියාපදිංචි සහතිකයක් දරණ සෑම තැනැත්තකු විසින්ම එකී බීඩි කර්මාන්ත ශාලවේ කිසියම් සතියක් තුළ නිෂ්පාදනය කරනු ලබන්නා වූ සෑම බීඩියක් සඳහාම අදාළ වූ දුම්කොළ බද්ද ඉන් ඉක්බිතිවම එළඹෙන සතියේ අවසානයට පෙර ගෙවනු ලැබිය යුතු අතර, නියමිත දිනට ගෙවීමට අපොහොසත් වන එකී දුම්කොළ බද්ද සම්බන්ධයෙන් එක් ලිත් මසකට සියයට තුන (3%) බැගින් වන ප්‍රමාද ගාස්තුවක් ද ගෙවිය යුතු වන්නේ ය.

4. එකී බීඩි නිෂ්පාදකයකු වශයෙ න් වලංගු ලියාපදිංචි සහතිකයක් දරණ සෑම තැනැත්තෙකු විසින්ම අදාල බීඩි කර්මාන්ත ශාලාවේ කිසියම් සතියක් තුළ නිෂ්පාදනය කරනු ලැබූ බීඩි ප්‍රමාණය හා ඒ සඳහා ගෙවිය යුතු බීඩි සඳහාවූ දුම්කොළ බද්ද සඳහන් කරමින් තමා විසින් අත්සන් කොට සහතික කරන ලද දුම්කොළ බද්ද සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත හෝ තත් කාර්යය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් බලය පවරනු ලැබූ සුරාබදු පරීක්ෂක තනතුරට නොඅඩු නිළධාරියෙකු වෙත එම සතිය අවසන් වී එළඹෙන රාජකාරී දින 02 ක් අවසන් වීමට පෙරාතුව සැපයිය යුතුය.

5. එකී බීඩි නිෂ්පාදකයෙකු වශයෙන් වලංගු ලියාපදිංචි සහතිකයක් දරණ තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන එකී දුම්කොළ බදු ප්‍රකාශය, 1999 අංක 08 දරණ දුම්කොළ බදු පනතේ 3(4) උප වගන්තියේ ප්‍රකාරව සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද හෝ සපයන ලද නියමිත ආකෘතියක් මඟින් ඉදිරිපත් කල යුතු අතර , එය සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ හෝ තත් කාර්යය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් බලය පවරනු ලැබූ සුරාබදු පරීක්ෂක තනතුරට නොඅඩු නිළධාරියෙකුගේ ගිණුම් පරීක්ෂාවට යටත් විය යුතුය.

6. බීඩි නිෂ්පාදකයකු වශයෙන් ලියාපදිංචි සහතිකයක් දරණ සෑම බීඩි කර්මාන්ත ශාලාවක් තුළම, තත් කාලයෙහි බල පවත්නා වූ දුම්කොළ බදු (සාමාන්‍ය) නියෝග මඟින් හා වරින් වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුන්වා දෙනු ලබන ලේඛන, පොත් පත්, ආකෘති, ප්‍රකාශ හා වාර්තා දෛනිකව යාවත් කාලීන කරමින් පවත්වා ගෙන යා යුතු අතර, ඒවා පරීක්ෂාවට ඉල්ලූ වහාම සුරාබදු කොමසාරිස් ජනරාල්හට හෝ තත් කාර්යය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් බලය පවරනු ලැබූ සුරාබදු පරීක්ෂක තනතුරට නොඅඩු නිළධාරියකුහට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

7. සැපයුම් දාමයද ඇතුළුව සමස්ත බීඩි නිෂ්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය හා පරීක්ෂා කිරීම සඳහා සුරාබදු පරීක්ෂක තනතුරට නොඅඩු නිළධාරියකු හෝ නිළධාරීන් අනුයුක්ත කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට කටයුතු කල හැකිය.

8. බීඩි සඳහා අය කරනු ලබන දුම්කොළ බද්ද සම්බන්ධයෙන් අදාල වන මෙම නියෝග 2009.10.26 දින ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 1625/1 හි සඳහන් නියෝග හා එහි අනුප්‍රාප්තික සංශෝධනවලට සමාන්තරව ක්‍රියාත්මක විය යුතු වන්නේය.